# Weekly SITUATION REPORT
# Emergency Operation Centre, DISASTER MANAGEMENT CENTRE
## තත්ව වාර්තා සටහන් සතිපතා - හදිසි මෙහෙයුම් මැදිරිය

**මාර්තු 01-2010 සිට මාර්තු 07- 2010 දක්වා**

| |
|---|
| **2010.03.01 දින නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ හාවාඑළිය බටහිර ග්‍රාම නිලධාරි වසමේ පිදුරුතලාගල රක්ෂිතයේ ඇතිවූ හිදිසි ගිනි ගැනිම**<br><br>වන භූමි අක්කර 04 පමණ ගිනි ගැනිමෙන් විනාශ විය. ගින්න ව්‍යාප්ත වීම වැලැක්වීම සදහා දිස්ත්‍රික් අඩවි වන නිලධාරින්, නුවරඑළිය යුධ හුමුදා කදවුරේ හා පොලිසියේ නිලධාරින් සමග අවට ප්‍රදේශවාසින්ගේ සහයෝගය ඇතිව ගිනිවැටක් ක්ෂණිකව සකස් කිරිමට කටයුතු කර ඇති අතර ගින්න මැඩපැවැත්වීම සදහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් ශ්‍රි ලංකා ගුවන් හමුදාවේ සහයෝගය ලබා ගන්නා ලදි. |
| **2010.03.01 දින නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ නුවරඑළිය පොලිස් වසමේ හාවාඑළිය හොලිට්නින්ට් දෙමළ විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ කාර්යාලය සහිත කාමරයේ විදුලි කාන්දුවිමක් හේතුවෙන් ගින්නක් හට ගැනිම**<br><br>එක් නිවසක් අර්ධ ලෙස හානියට පත්වු අතර ගින්න මුළුමනින්ම මැඩ පැවැත්විමට නුවරඑළිය ගිනි නිවන ඒකකය හා පොලිසිය සමග එක්ව කටයුතු කර ඇත. |
| **2010.03.04 මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවට කෝරළය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය හන්තාන රක්ෂිතයේ ගින්නක් ඇතිවීම**<br><br>උදාල ගින්නෙන් හන්තාන රක්ෂිතයේ අක්කර 35 ක පමණ ප්‍රමාණයක විනාශ වු අතර මහනුවර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධිකරණ ඒකකය,යුධ හමුදාව, පොලිසිය, මහනුවර නාගරික ගිනි නිවිමේ ඒකකය හා මහනුවර දිස්ත්‍රික් ලේකම්තුමා සමග ඒකාබද්ධව ගින්න සම්පුර්ණයෙන්ම නිවා දැමිම සදහා සම්බන්ධිකරණ කටයුතු සිදු කරන ලදි.. |

Prepared by : H.M.D.Nilusha